# කටුවන ඕලන්ද බලකොටුව ඉදිකිරීමේ ඇති වැදගත්කම පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**රණවීර.ආර්.ඒ.කේ.එස්,[1] සඳරුවන්.එම්.අයි.ටී,[2] සේනාතිලක.එන්.එච්.ඩී.එම්.ඕ.කේ[3]**

ලන්දේසීන් විසින් රට අභ්‍යන්තරයේ ඉදිකරන ලද බලකොටු අතරින් වඩාත් සුරක්ෂිතව පවතින කටුවන කොටුව ඓතිහාසිකමය හා භූගෝලීය වශයෙන් ඉතාමත් වැදගත්කමක් උසුලයි. එය හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. මෙහි පිහිටීම ඓතිහාසිකමය හා භූගෝලීය වශයෙන් ආරක්ෂිත ස්ථානයක් ලෙස අතීතයේ සිට වැදගත්කමක් උසුලන්නේද යන්න පර්යේෂණ ගැටලුව පාදක කරගනිමින් අධ්‍යයනය සිදු කරයි. මෙම අධ්‍යයනයේ දී වංසකතා සාහිත්‍යයේ එන කරුණු මඟින් පැරණි හා භෞතික පිහිටීම හඳුනාගැනීමෙන් බලකොටුවක් නිර්මාණය කළ බව පෙන්වා දීම අපේක්ෂා කෙරේ. මේ සඳහා ක්ෂේත්‍ර හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයන තුළින් දත්ත රැස්කර ගනු ලැබීය. මෙම කටුවන බලකොටුව ඕලන්දයන් ආරක්ෂිත මධ්‍යස්ථානයක් වශයෙන් ඉදිකිරීමට පෙර පැරණි සිංහල පාලකයින් පවා දැන සිටි ස්ථානයක් බව වංශකතා නිදර්ශන සපයයි. එනම් මහා පරාක්‍රමබාහු රජු සමයේ දී රුහුණු ප්‍රදේශය මුල්කොටගෙන රජුට විරුද්ධව යුධ සංවිධානය කළ සුගලා බිසවගේ බලකොටුවක් බව දක්වා තිබීමෙනි. ''රක්ඛ නම් සෙනෙවි තෙමේ ඒ සේනාව සමග යුධ කෙරෙමින් බොහෝ බලසෙන් මරවමින් ඔවුන් විසින් මාර්ගයෙහි සිද හෙළන ලද රැක් සිදමින් කටුවන නම් තැනට ගොස් මහා බල ඇත්තේ එහි බලකොටුවක් කොටගෙන උන්නාවූ සතුරු සේනාව හා යුධ කොට ඒ කොටුව බිඳ හේ තෙමේ ඇතුල්ව නොයෙක්....'' යනුවෙන් දැක්වීමෙනි. එමෙන් ම භූගෝලීය වශයෙන් ද මෙම ස්ථානය ආරක්ෂිත වූ බව භෞතික සාධක තුළින් විද්‍යාමාන වේ. කෙසේදයත් ඕලන්දයින් තමන්ට සිදුවන සමුද්‍රීය තර්ජන තුළින් ආරක්ෂා වීමට පිහිටුවන ලද අභ්‍යන්තරික බලකොටුවක් ලෙස මෙය වැදගත් වේ. මෙය මුහුදු සීමාවට සැතපුම් 20ක් පමණ දුරින් පිහිටීමත් කොටුවට බටහිරෙන් කටුවන නදිය තිබීමත් හේතුවෙන් ආරක්ෂිත බව තරවී තිබෙන්නට ඇත. එමෙන් ම මෙම ස්ථානයේ බටහිරින් හා වයඹ දිගින් රම්මල් කන්ද, හිගුර කන්ද, කරිවිල කන්ද පිහිටීමෙන් මෙහි බලකොටුවක් තැනීමට සුදුසු පරිසරයක් නිර්මාණය වී ඇතැයි පෙන්වා දිය හැකිය. තව ද ඕලන්දයින් සිංහල හමුදාවගේ ප්‍රහාරයන්ගෙන් ආරක්ෂා වීමට මෙහි කාලතුවක්කු 12ක් සවිකළ හැකි පරිදි බැස්ටියන් දෙකක් නිර්මාණය කොට පිටතින් අඩි 20ක් උස පවුරක් නිර්මාණය කර ඇත. එමෙන් ම කොටුවකට අත්‍යවශ්‍ය යුධ උපකරණ ගබඩාවක්, ශල්‍යාගාරයක් හා ජල අවශ්‍යතා සපුරා ගැනීමට ලිඳක් වැනි ඉදිකිරීම් දක්නට තිබූ බව විදේශීය වාර්තාවල සඳහන් වෙයි. මේ ආකාරයෙන් බලකොටුවක් ඉදි කිරීමට අත්‍යවශ්‍ය වූ සියලු සාධකයන් මෙහි පැවතීමත් භූගෝලීය හා ඓතිහාසිකමය සාධක තහවුරු කර පරිදි ආරක්ෂාවට වැදගත් ස්ථානයක් වීමත් තුළ කටුවන බලකොටුවට ඉතාමත් වැදගත්කමක් හිමි වන බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** කටුවන, ඕලන්දය, බලකොටුව, ආරක්ෂාව, ස්ථානය

[1,2,3]පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය. kasun.ra95@gmail.com